ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!

බුද්ධිමත් පාඨකයින් ලෙසින්, අප මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන සමාජ ගැටලුව මෙන්ම, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූවන් ව නිසි පුනරුත්ථාපනයකින් පසු නැවත සමාජය හා එක්කර ගැනීම සම්බන්ධයෙන්ද විමසා බැලිය යුතුයි. එසේම එහිදී මාධ්‍ය අතර පවතින සමාජ වගකීම ද අවබෝධ කරගත යුතුයි.

එම පසුබිමෙහි තබා, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සම්බන්ධ පුවත් දෙකක් දිනමිණ (අගෝස්තු 08, 2033) වාර්තා කර ඇති අන්දම සලකා බලමු.

* "යතුරුපැදිය ලුහුබැඳ කුඩ්ඩන් දෙදෙනා අත්අඩංගුවට ගනියි" ("පුද්ගලයන් දෙදෙනකු" යැයි අන්තර්ගතයේ සඳහන් වේ.)

* "කුඩ්ඩන් ගෙන් ප්‍රශ්න කිරීමේදී රන් මාලයක් පෙන්ඩනයක් සොයා ගැනේ" ("සැකකරුවන්" දෙදෙනෙකු යැයි අන්තර්ගතයේ සඳහන් වේ.)

ඔබ සිතන ලෙසට,

1 )සමාජයේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් කෙරෙහි එල්ල වෙන්න ගර්හාව සහ කොන් කිරීම, මෙම සිරස්තලයන්හි දැක්වෙන "කුඩ්ඩා" වැනි යෙදුම් ඔස්සේ තවත් තීව්‍ර නොවන්නේ ද? එවැනි සෘණාත්මක ලේබල් කිරීම් හේතුවෙන්, පුනරුත්ථාපනය කින් පසුව හෝ ඔවුන්ට සමාජය හා යළි එක් වීමට බාධා නො පැමිණෙන්නේ ද?

2) ඒ අනුව "කුඩ්ඩා" වැනි යෙදුම් වෙනුවට, 'මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්', 'මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්' වැනි යෙදුම් හෝ, මෙම පුවත් අන්තර්ගතයන්හි දක්වා ඇති ලෙසට සරලවම 'සැකකරුවන්' හෝ 'පුද්ගලයින්' යන යෙදුම් භාවිතය වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!